**ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය – 2017**

------------------------------------------------------------------------------------------------------------

2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශන සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ (“කාර්යාංශය“) මූල්‍ය ප්‍රකාශන හා කාර්යාංශයේ හා එහි පරිපාලිතයෙහි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය හා 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 29(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර කාර්යාංශයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.**

------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යයැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම.**

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කාර්යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

**1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

---

**2.1 මතය**

---

**(අ). තත්ත්වාගණනය කළ මතය - සමූහය**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ හා එහි පරිපාලිතයෙහි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**(ආ). තත්ත්වාගණනය කළ මතය - කාර්යාංශය**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---

**2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

---

(අ) ශ්‍රී. ල.වා.ප්‍ර. 7 - මූල්‍යමය උපකරණ හෙළිදරව් කිරීම
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ එක් එක් වර්ගීකරණයන් යටතේ වූ මූල්‍යමය වත්කම් හා වගකීම් වල ධාරණ අගය හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලං. ගි. ප්‍ර. 01 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
ප්‍රමිතය අනුව ආයතනයේ ජංගම හා ජංගම නොවන වර්ගීකරණයට අදාලව ගිණුම්කරණ ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලං. ගි. ප්‍ර. 12 - ආදායම් බදු
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ප්‍රමිතයේ පරිච්ඡේද අංක 81 (ජී) අනුව හඳුනාගත් කල්බදු වත්කම් හා වගකීම් ශේෂයන් සෑම ආකාරයේම තාවකාලික වෙනස්වීම් සෑම ආකාරයේම ප්‍රයෝජනයට නොගත් බදු අලාභයන් සහ බැර කිරීම් හෙළිදරව් කිරීම කල යුතු වේ. කෙසේ වුවද, ප්‍රමිතය අනුව වූ නියමයන් කාර්යාංශය හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලං. ගි. ප්‍ර. 32 - මූල්‍ය උපකරණ ඉදිරිපත් කිරීම ප්‍රමිතය අනුව ආයතනය ඉදිරියට කළ ගෙවීම්, මුදලින් නොලැබුන හෝ අනෙකුත් මූල්‍යමය වත්කම් ලැබීමට අයිතිවාසිකමක් ලැබූ ලෙස සැලකිය නොහැක. එසේම ඉදිරියට කළ වියදම් මූල්‍ය වත්කම් ලෙස සැලකිය නොහැක. කෙසේ වුවද, 2017 දෙසැම්බර් 31 දිනට රු. 7,544,502 ක්වූ ඉදිරියට කළ ගෙවීම් මූල්‍යමය වත්කම් ලෙස සළකා තිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

**-------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

අ) මූලික කාර්යාල 02 කට අදාලව ණයගැතියන්ගෙන් ලැබිය යුතු රඳවාගැනීම් අත්තිකාරම් එකතුව රු. 11,433,011 ක බැර ශේෂය අදාල හර ශේෂයන්ට එරෙහිව කපාහැර තිබුණි. ඒ අනුව, වෙළඳ හා අනෙකුත් ලැබීම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි. එම නිසා වෙළඳ හා අනෙකුත් ගෙවීම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි. බත්තරමුල්ල මූලික කාර්යාලයේ රු.23,419,945 ක් වූ ණයහිමියන්ගේ හර ශේෂයන් ණයහිමියන්ට එරෙහිව කපා හැර තිබුණි.

ආ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් 2012 වර්ෂයේ මාර්ග ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ලැබුණු රු. මිලියන 3,351 ක් වටිනා ප්‍රාග්ධන වත්කම් ලෙස ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන, දේපල පිරියත හා උපකරණ රජයේ ප්‍රදාන ලෙස ගිණුම්ගත කර නොතිබුණි. කෙසේ වුවද, 2017 ජනවාරි 01 දිනට යන්ත්‍ර හා උපකරණ නැවත අගය කර තිබුණු බව පෙර වර්ෂයේ වාර්තාවේ දක්වා තිබුණි. කෙසේ වුවද කාර්යාංශය එම වත්කම් 2017 වර්ෂය අවසානයටද නැවත අගය කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**-------------------------------------**

අංශ දෙකකට අදාලව ලැබිය යුතු හා ගෙවිය යුතු එකතුව පිළිවෙළින් රු. 1,703,121,917 ක් හා රු. 642,350,707 ක් වසර හතරකට වැඩි කාලයක් අයකර ගැනීමෙන් තොරව හිඟ හිටව රැඳී පැවති අතර ජාත්‍යන්තර අංශයේ ලැබිය යුතු ශේෂය වූ රු. 2,119,986 ක් 2017 දෙසැම්බර් 31 දිනට වසර දෙකකට වැඩි කාලයක් හිඟ හිටව රැඳී පැවතුණි.

**2.2.4 හඳුනා නොගත් වෙනස්කම්**

**--------------------------------**

ලැබිය යුතු ශේෂයන්ට අදාලව මධ්‍යම පළාත් ඉංජිනේරු ප්‍රසම්පාදන ඉදිකිරීම් අංශයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන් හා කාර්යාංශය ලබාදුන් විස්තරාත්මක උපලේඛනයන් අතර රු. 17,095,967 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

**-------------------------------------**

2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වුනු එකතුව පිළිවෙලින් රු.8,475,707,071 ක හා රු. 5,338,238,467 ක්වූ ණයගැතියන් හා ණයහිමියන්ට අදාළව ශේෂ සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් නොවුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

(අ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ කාර්යාංශය හා සමූහයේ මෙහෙයුම් වලින් වූ ප්‍රතිඵලය පිළිවෙලින් රු. 401,305,256 ක හා රු. 522,183,174 ක බදු පසු ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ බදු පසු ශුද්ධ ලාභය පිළිවෙලින් රු. 439,663,403 ක් හා රු. 524,220,763 ක් වූයෙන් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵල පහත වැටීම පිළිවෙලින් රු.38,358,147 ක් හා රු. 2,037,589 ක් දැක්වුණි. පසුගිය වර්ෂයට සාපේක්ෂව වෙනත් ආදායම් රු. 93,171,190 කින් අඩුවීම හා පරිපාලන වියදම් රු. 116,615,298 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයෙහි අවාසිදායක තත්ත්වයන් කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය සමග පසුගිය වසර හතරක බදු පසු ශුද්ධ ලාභය සමඟ සැසඳීමේදී 2013 වර්ෂයේ බදු පසු ශුද්ධ ලාභය රු. 328,222,120 ක් වුවද 2017 වර්ෂයේදී බදු පසු ශුද්ධ ලාභය රු. 401,305,256 ක් වී තිබුණි. සේවක දීමනා, ක්ෂය හා බදු ගැලපුම් කළ පසු සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 2,356 ක අගයක් එකතු වී තිබුණි. පසුගිය වර්ෂයේ අගය වැඩිවීම රු. මිලියන 2,006 ක් විය.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) සේවකයින් 1,350 ක පිරිස් බලයකින් යුත් එහි කාර්ය මණ්ඩලය හා රු. මිලියන 21,856 ක් වූ මුළු වත්කම් උපයෝජනය කර ගනිමින් සමාලෝචිත වර්ෂය තුළදී කාර්යාංශය විසින් රු. මිලියන 756 ක බදු පූර්ව ශුද්ධ ලාභයක් උපයා තිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂයේ ඉපයීම මුළු වත්කම්වලින් සියයට 3.46 ක ප්‍රතිශතයක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ලාභ ආන්තිකය හා ශුද්ධ ලාභ ආන්තිකය පිළිවෙලින් සියයට 3.4 ක් හා සියයට 3.04 ක් වූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව මෙම ලාභ ආන්තික පිළිවෙලින් සියයට 2.5 ක් හා සියයට 1.2 කින් අඩු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

කාර්යාංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂයේ විදේශීය අංශයේ පාරිභෝගික තෘප්තිය උපරිම කිරීම, අපේක්ෂිත යටිතල පහසුකම් සංවර්ධනය ලඟා කරගැනීම් හා නැගෙනහිර අප්‍රිකානු කලාපයේ ජල සම්පත් සංවර්ධනය වැනි අරමුණු ලඟාකර ගෙන නොතිබුණි.

## 4.2 මතභේදයට තුඩු දෙන ගණුදෙනු

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) පෙර වර්ෂයන්හිදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරු තිදෙනෙකුට නිල නිවාස තුනක් භාර දී තිබූ අතර ඔවුන් විසින් මාසික කුලිය ගෙවා නොතිබුණි. තවද ඔවුන් අතරින් එක් අයෙකු 2004 වර්ෂයේ සිට කුලී ගෙවා නොතිබූ බව තව දුරටත් නිරීක්ෂණය විය.

(ආ) භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබා ගැනීමෙන් තොරව කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එහි සේවකයන්ට දිරි දීමනා යෝජනා ක්‍රම කිහිපයක් අනුමත කර තිබුණි. 2017 වර්ෂය තුලදී එසේ ගෙවන ලද මුළු දිරි දීමනා මුදල රු. 67,027,249 ක් විය.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 5.1 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් කළමනාකරණය

### 5.1.1 ප්‍රසම්පාදනයන්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

අ) කාර්යාංශයේ මූල්‍ය බලතල පැවරුම් ලේඛනය අනුව රු. මිලියන 02 ක ඉක්ම වූ ප්‍රසම්පාදනයන් සඳහා තරඟකාරී මිල ගණන් අදාල කරගත යුතු වේ. කෙසේ වුවද ප්‍රධාන කාර්යාලයේ ඉහත සීමාවන් ඉක්මවූ ප්‍රසම්පාදනයන් 06 ක් සඳහා මිල සැදහුම් ක්‍රමය භාවිතා කර තිබුණි.

ආ) ප්‍රසම්පාදන අත්පොතේ අතිරේක අංක 32 අනුව සෘජු කොන්ත්‍රාත් ක්‍රමයට කරන ලද ප්‍රසම්පාදනයන් සඳහා කමිටු සාමාජිකයින්ට ගෙවීම් කළ නොහැක. කෙසේ වුවද, ප්‍රසම්පාදන කමිටු සාමාජිකයින්ට රු. 53,000 ක ප්‍රසම්පාදන කමිටු දීමනා හා තාක්ෂණික ඇගයීම් කමිටු දීමනා වශයෙන් රු. 16,000 ක් ප්‍රසම්පාදන මඟපෙන්වීම් වලට පටහැනිව ගෙවා තිබුණි.

ඇ) 2017 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන් නිමකළ ඉංජිනේරු ප්‍රසම්පාදන ඉදිකිරීම් අංශයේ ව්‍යාපෘති 13 කට අදාලව අයකර නොගත් සචලීකරණ අත්තිකාරම් එකතුව වූ රු. 22,067,146 ක් ගිණුම් වල රැඳී තිබුණි. ව්‍යාපෘති නිමවුම් ප්‍රතිශතය සියයට 90 වන විට සචලීකරණ අත්තිකාරම් සම්පූර්ණයෙන් අයකර යුතු හෙයින් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය නිකුත් කළ ඉක්ටෑඩ්/ එස්බිඩ්/ 02 හි 3 වන පරිච්ඡේදයේ 14.2(බී) වගන්තිය අනුව එම ශේෂය අසාමාන්‍ය විය.

## 5.2 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත ආදායම සහ තථ්‍ය ආදායම හා තථ්‍ය වියදම අතර පරතරය සියයට 44 සිට සියයට 137 දක්වා විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති පාලන අඩුපාඩු මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශයේ සභාපතිගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුවේ.

| පාලන ක්ෂේත්‍රය | | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | 2017 දෙසැම්බර් 31 දිනට වැඩ බිම්වල වූ ඉන්වෙන්ට්‍රි සහ ආපසු භාර දියයුතු තොග මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබුණි. |
| (ආ) | වත්කම් කළමනාකරණය | අමාත්‍යාංශයෙන් ලැබුණු ස්ථාවර වත්කම් ගිණුම් වලට ගෙන නොතිබුණි. |
| (ඇ) | ආදායම් කළමනාකරණය | උපදේශන සේවාවන්ට අදාල තථ්‍ය කළ වැඩ මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. |